තාක්ෂණ අමාත්‍යාංශය தொழில்நுட்ப அமைச்சு MINISTRY OF TECHNOLOGY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | පු.ලි.දෙ./මෙ/මාධ්‍ය ඒකකය/ මාධ්‍ය නිවේදන හා දැන්වීම් | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2021.08.13 |

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

## මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි.

## <u>පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සියලුම මහජන සේවාවන් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීම.</u>

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනකු කොරෝනා වසංගතයට ගොදුරු වීම සහ ආශ්‍රිතයන් වීම හේතුවෙන් අභ්‍යන්තර කාර්යමණ්ඩලය සීමාකිරීමට සිදු ව ඇති බැවින් 2021.08.16 වන දින සිට ප්‍රධාන කාර්යාලය සහ සියලු පළාත් කාර්යාල නැවත දැනුම් දෙන තුරු මහජනතාව සඳහා විවෘත නොකිරීමට තීරණය කර ඇත.

02. එසේ වුවද, දෙපාර්තමේන්තුව මහජනතාව සඳහා විවෘත නොකරන ඉදිරි දිනයන්හි ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා දින හා වේලාවන් වෙන් කරගත් සියලුම ඉල්ලුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත් එදිනම හෝ ඊට පෙර සකස් කර තැපැල් මඟින් ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරනු ඇත. තවද, මේ දක්වා ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම්පත් යොමු කළ ඉල්ලුම්කරුවන් සඳහා ද ජාතික හැඳුනුම්පත් කඩිනමින් සකස් කර තැපැල් මඟින් යොමු කිරීමට කටයුතු කරනු ඇත.

03. එමෙන්ම, විභාග කටයුතු, සම්මුඛ පරීක්ෂණ කටයුතු, විදෙස් ගමන් බලපත් ලබා ගැනීම වැනි හදිසි හා අත්‍යවශ්‍ය කටයුතු සඳහා ජාතික හැඳුනුම්පත කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලුම්කරුවන්ට තම හදිසි අවශ්‍යතාව රජයේ වැඩ කරන දිනවල රාජකාරී වේලාව තුළ දී පහත දුරකථන අංක ඔස්සේ දෙපාර්තමේන්තුවට දැනුම් දිය හැකි අතර එම ඉල්ලුම්කරුවන් සඳහා ද කඩිනමින් හැඳුනුම්පත් නිකුත් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇත.

04. මීට අමතරව ජාතික හැඳුනුම්පත් සම්බන්ධයෙන් මහජනතාව වෙත සැපයෙන අනෙකුත් සේවාවන් පිළිබඳ වැඩිදුර විමසීම් පහත දුරකථන අංක ඔස්සේ සහ info@drp.lk විද්‍යුත් ලිපිනය හරහා ලබා ගත හැකි බව ද කාරුණිකව දන්වමි.

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | දුරකථන අංක- | 0115226126 / 0115226100 |
| දකුණු පළාත් කාර්යාලය | දුරකථන අංක- | 0912228348 |
| වයඹ පළාත් කාර්යාලය | දුරකථන අංක- | 0372224337 |
| නැගෙනහිර පළාත් කාර්යාලය | දුරකථන අංක- | 0652229449 |
| උතුරු පළාත් කාර්යාලය | දුරකථන අංක- | 0242227201 |

වියානි ගුණතිලක
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්